## 10. ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### 10.1 විගණන විෂය පථය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 6 දින කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 10.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 10.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි සඳහන්

පොදු නිරීක්ෂණ සහ පහත 10.4 සිට 10.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---

ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට සේවයෙන් ඉල්ලා අස්විම මත හිඟහිට තිබූ ණය ශේෂවල එකතුව රු.180,887 ක් විය.

**(ආ) අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම**

---

ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අත්තිකාරම් ශේෂවල එකතුව රු.14,735,702 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| කාලය (වසර) | නඩු සංඛ්‍යාව | වටිනාකම රු. |
|---|---|---|
| 1 ට අඩු | 76 | 6,601,980 |
| 2 ත් 5ත් අතර | 156 | 4,787,425 |
| 5 ත් 10 ත් අතර | 62 | 2,953,700 |
| 10 ත් 20 ත් අතර | 43 | 389,720 |
| 20 ත් 30 ත් අතර | 08 | 2,625 |
| 30 ට වැඩි | 03 | 252 |
| | 348 | 14,735,702 |

## 10.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

## 10.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත්පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් කොමිෂන් සභාව විසින් පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. මෙම කොමිෂන් සභාවේ කාර්ය භාරය අනුව සංයුක්ත සැලැස්මක් සකස් කිරීම අපහසු කාර්යයක් බවත්, එබැවින් මෙම අවශ්‍යතාවයෙන් කොමිෂන් සභාව නිදහස් කරන ලෙස මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති බවත්, කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් 2014 ජනවාරි 24 දින මා වෙත දන්වා එවා තිබුණි.

## 10.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 නොවැම්බර් 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 10.4.3 අභ්‍යන්තර විගණනය

කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

## 10.4.4 විගණන හා කළමණාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

සභාව විසින් විගණන හා කළමණාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි.

## 10.5 වත්කම් කළමනාකරණය

කොමිෂන් සභාව සතු වාහනයක් උතුරු පුනරුත්ථාපන, ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශයට ලබා දී තිබූ නමුත් එය ආපසු ලබාගැනීමට හෝ එම අමාත්‍යාංශය වෙත පවරාදීමට 2013 නොවැම්බර් 15 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 10.6 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දූෂණයට එරෙහිව සහනයක් ලබා දීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සළසා තිබූ නමුදු ඒ වෙනුවෙන් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදි නඩු භාණ්ඩ පිළිබඳ විස්තර පරිගණකගත කිරීමේ ක්‍රමයක් පිළිබඳව යෝජනාවී තිබුණද එය 2013 නොවැම්බර් 15 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 10.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 21 | 13 |
| (ආ) | තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (ඇ) | ද්විතියක මට්ටම | 63 | 51 | 12 |
| (ඉ) | ප්‍රාථමික මට්ටම | 64 | 51 | 13 |
| | | 166 | 124 | 42 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 42 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.